00029

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන- හයවන මට්ටම 2016/2017

අවසාන පරීක්ෂණය - 2018

අධ්‍යාපන කළමනාකරණය - ESU4115

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.02.01 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

1 වන කොටස

01. සුදුසු නිර්වචනයක් ඇසුරින් කළමනාකරණ සංකල්පය පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ ව්‍යුහය ඇඳ දක්වන්න.

03. අධ්‍යාපන අමාත්‍යාංශයේ පරිපාලන වගකීම් පහක් (05) ලැයිස්තු ගත කරන්න.

04. "බාහිර කාර්යක්ෂමතාව" හා "අභ්‍යන්තර කාර්යක්ෂමතාව" යන සංකල්ප උදාහරණ දෙකක් (02) සහිතව වෙන් කොට දක්වන්න.

05. පාසල් මට්ටමේ අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලියේ වැදගත්කම පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ පවතින ගැටලු පහක් (05) සඳහන් කරන්න.

07. මැක්ස් වෙබර්ගේ නිලතන්ත්‍රවාදී ආකෘතියේ ඇතුළත් මූලික කරුණු පහක් (05) සඳහන් කරන්න.

08. ඵලදායී විදුහල්පතිවරයෙකුගෙන් අපේක්ෂා කරනු ලබන නායකත්ව ගුණාංග පහක් (05) ලැයිස්තුත ගත කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) කළමනාකරණ ක්‍රියාවලියේ මූලික සංරචක මොනවාදැයි දක්වන්න. (ලකුණු 04)

(ii) ඉන් එක් සංරචකයක් තෝරාගෙන නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) තෝරාගත් සංරචකයට අදාළව පාසලක් මුහුණ දිය හැකි ගැටලු තුනක් **(03)** හඳුනාගෙන, එම ගැටලු විසඳීම සඳහා ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

10. (i) "විද්‍යාත්මක කළමනාකරණය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) විද්‍යාත්මක කළමනාකරණයේ මූලිකාංග හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 08)

(iii) ඔබ සඳහන් කළ මූලිකාංග අධ්‍යාපන ක්ෂේත්‍රයට කෙතරම් අදාළ වේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

11. (i) ශ්‍රී ලංකාව තුළ පවතින අධ්‍යාපන කළමනාකරණ පුහුණු අවස්ථා හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) අධ්‍යාපන කළමනාකරණ පුහුණුවක දී සලකා බැලිය යුතු වැදගත් ක්ෂේත්‍ර මොනවා ද? (ලකුණු 06)

(iii) අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම තුළින් අධ්‍යාපන පද්ධතියට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් **(04)** සඳහන් කර, ඉන් එකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) 'ඵලදායීතාව' හා 'කාර්යක්ෂමතාව' යන සංකල්ප අර්ථ දක්වන්න. (ලකුණු 04)

(ii) ඵලදායී පාසලක ලක්ෂණ හතරක් **(04)** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) පාසල ඵලදායී හා කාර්යක්ෂම කර ගැනීම සඳහා සම්පත් කළමනාකරණයේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. (i) 'අධීක්ෂණය' යන්න සුදුසු නිර්වචනයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) පාසල් මට්ටමේ අධීක්ෂණ ක්‍රියාවලියක් තුළ අන්තර්ගත විය යුතු ප්‍රධාන ක්ෂේත්‍ර මොනවා ද? (ලකුණු 06)

(iii) පාසල් මට්ටමේ අධීක්ෂණ ක්‍රියාවලිය තුළ උද්ගත වී ඇති ගැටලු තුනක් **(03)** සඳහන් කර, එම ගැටලු විසඳා ගැනීම සඳහා යෝග්‍ය යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

14. පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් **(02)** සඳහා කෙටි සටහන් ලියන්න.

(i) පාසලේ පවත්නා කළමනාකරණ ගැටලු

(ii) "ළඟම පාසල හොඳම පාසල" සංකල්පය

(iii) පාසලේ කළමනාකරණ ක්‍රියාවලියට ගුරුවරයාගේ දායකත්වය

(iv) පාසල් පාදක කළමනාකරණය

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.